# බුද්ධචරිතයේ නායකත්ව ලක්ෂණ සංඝ සංස්ථාවට අදාළ ප්‍රායෝගික නායකත්වය සඳහා උපයෝගී කරගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනයක්

කේ.එල්.ඩී. කුමාරි - බෞද්ධ අධ්‍යයනාංශය

අපේක්ෂිත අරමුණු වෙත ළඟාවීම සඳහා තම සහායකයන් හෝ කණ්ඩායම පොළඹවා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදිය හැකි පුද්ගලයා නායකයා වේ. පුද්ගල අනන්‍යතා ලක්ෂණ මත නායකත්වයේ විවිධත්ව ගනී. පුද්ගල ජීවිතයට ඉතාම සමීප පැතිකඩක් මෙමඟින් නියෝජනය වේ. නායකත්වයට අදාළ බුද්ධචරිතාගත සංකල්ප සංඝ සංස්ථාවේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිද යන ප්‍රස්තුතයට අදාළව ශාස්ත්‍රීය මූලාශ්‍රය භාවිත කරමින් අදාළ බෞද්ධ ඉගැන්වීම් හඳුනාගෙන පැහැදිලි කිරීම මෙහි ශාස්ත්‍රීය අරමුණ විය. ඒ අනුව නායකත්ව සංකල්පයට අදාළ පර්යේෂණ කෘති හා ලිපි ආශ්‍රයෙන් ප්‍රස්තුතයට අදාළ ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතීයික දත්ත රැස් කොට, විශ්ලේෂණය කරමින් පර්යේෂණය සිදු කෙරේ. මේ අනුව නායකත්වය පිළිබඳ විවිධ අදහස් මේ වන විට ඉදිරිපත් වී ඇති අතර බුද්ධචරිතයම නිදර්ශනයක් කොට ආදර්ශ ගත හැකි අයුරින් එම නායකත්වය පැහැදිලි කරදෙන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි දී සිදු වේ. සංඝ සංස්ථාව නම් වූ සමාජ සංවිධානය නායකත්ව සංකල්ප අනුව ගොඩනැගූ මූලික හා සංවිධානාත්මක මිනිස් සමාජය බව ත්‍රිපිටකාගත ආදී මූලාශ්‍රය ආශ්‍රයෙන් ශාස්ත්‍රීයව තහවුරු කරගෙන ඇත. බුදුන්වහන්සේගේ සුවිශේෂ අනන්‍යතා ලක්ෂණයක් වන යථාවාදී තථාකාරී ගුණය න්‍යාය සහ ප්‍රායෝගිකතාව සංඝ සංස්ථාවේ උක්ත සාර්ථකත්වය සඳහා හේතු වූ බව අනුමාන කළ හැකිය. මෙවැනි න්‍යායාත්මක අර්ථකථන තුළින් බුද්ධචරිතයේ නායකත්ව ලක්ෂණ සංඝ සංස්ථාවේ නායකත්වය ප්‍රායෝගිකව භාවිත කිරීමට වඩාත් පහසු වේ. සිව්වනක් පිරිස ගැන අධ්‍යයනය කරන විට බුද්ධචරිතයේ නායකත්ව ලක්ෂණ ඔවුන් සතුව පවතින-නොපවතින අවස්ථා පිළිබඳ අවබෝධයක් ලද හැකිය. බුදුදහමේ එන මෙම දහම් කරුණු අවබෝධ කර ගැනීම සෑම නායකයෙකුට ම පොදුය. සාධාරණය. මේ අනුව බුද්ධචරිතයෙන් මතු වන නායකත්ව ලක්ෂණ බාහිර සහ අභ්‍යන්තර දෙයංශයට ම එක් කරගැනීම සාර්ථක ඵලදායී නායකත්වයක් එම සමාජයේ බිහිකිරීමට හැකි බව දැනගත හැකි කරුණකි. එබැවින් නායකත්වයට අදාළ බෞද්ධ ඉගැන්වීම් බුද්ධචරිතය මගින් ප්‍රායෝගිකව සංඝ සංස්ථාවේ ක්‍රියාත්මක වී පවතින බව නිගමනයට ලක් විය.

***ප්‍රමුඛ පදඃ*** *නායකත්වය, බෞද්ධ නායකත්වය, සංඝසංස්ථාව, බුද්ධචරිතය*